**ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනය - 2016**

-------------------------------------------------

ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, අරමුදල් වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1993 අංක 47 දරන ක්‍රීඩා (සංශෝධිත) පනතේ 9 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී .ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ සමාගමේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විධායක කමිටුවේ වගකීම**

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම විධායක කමිටුවේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

----------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

**1.4 මතය ව්‍යාචනය සඳහා පදනම**

---------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ හා අරමුදල් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාළව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

**2. මූල්‍ය ප්‍රකාශන**

------------------

**2.1 මතය ව්‍යාචනය**

--------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---

### 2.2.1 කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

---

සම්මේලනයේ කාර්ය මණ්ඩලය වෙනුවෙන් සේවයේ ආරම්භක දිනයේ සිට එක් එක් වර්ෂය සඳහා මාස භාගයක වැටුප මත පදනම්ව රු.5,130,250 ක විශ්‍රාම ප්‍රතිලාභ වගකීමක් ගිණුම් ගත කර තිබුණද ප්‍රමිතයේ සේවක ප්‍රතිලාභ සම්බන්ධයෙන් වූ පරිච්ඡේද 28.15 අනුව, විශ්‍රාම ප්‍රතිලාභ වගකීමෙහි වර්තමාන වටිනාකම හඳුනාගෙන නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පළාත් පාලන ආයතන සමග ඇති කරගත් අවබෝධතා ගිවිසුම් මත සම්මේලනය මගින් භාවිතයට ගනු ලබන පළාත් පාලන ආයතන වලට අයත් ක්‍රීඩාපිටිවල සංවර්ධන කටයුතු සඳහා ජාත්‍යන්තර පාපන්දු සම්මේලනය මගින් සෘජුවම දේශීය හා විදේශීය කොන්ත්‍රාත්කරුවන් ලවා කරන ලද ඉදිකිරීම්වල අගය කල්බදු වත්කම් යටතේ වැරදි සහගත ලෙස ගිණුම් ගත කර තිබුණු අතර, ඒ මත විලම්භිත අයභාර බැරකමක් වශයෙන් රු.146,285,797 ක් ශේෂපත්‍ර දිනට ජංගම නොවන වගකීම් යටතේ දක්වා තිබුණි. මෙම අයභාර බැරකමින් රු. 8,291,439 ක් සමාලෝචිත වර්ෂයේ දී ආදායමට ගෙන තිබූ අතර ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා ස්ථාවර වත්කම් ක්ෂය, රු.3,400,664 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.17,507,848 ක් වූ මුදල් හා මුදල් සමාන දෑ ශේෂයෙන් එක් ජංගම ගිණුමක පැවති රු. 730,837ක් වූ අයිරා ශේෂයක් අඩුකර දක්වා තිබීම. හේතුවෙන් ජංගම වත්කම් හා ජංගම වගකීම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

### 2.2.3 මූල්‍ය අක්‍රමිකතා

---

තරඟ විනිසුරුවන් සඳහා යැයි දක්වමින් සිදු කළ ව්‍යාජ ගෙවීම් රු. 25,110,538 ක් සහ ජංගම ගිණුම් අතර හුවමාරු කිරීම් රු.20,295,000 කට අදාළව සිදු වී ඇති මුදල් වංචාව සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් වැඩිදුර පරීක්ෂණ පවතින අතර එම ගනුදෙනුවලට අදාළ ගෙවීම් වවුචර් පත්, මාරු නියෝග, ජ'නල් සටහන් හා උපලේඛන විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි.

### 2.2.4 නොසැසඳු පාලන ගිණුම්

---

පහත සඳහන් ගිණුම් විෂයයන්වලට අදාලව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂ හා අදාළ ලෙජර් ගිණුම් ශේෂ සමග සැසඳීමේදී එකතුව රු. 19,166,933 ක නොසැසඳීම් පැවතුණි.

| | ගිණුම | මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය | ලෙජරය අනුව ශේෂය | වෙනස |
|---|---|---|---|---|
| | | රු. | රු. | රු. |
| (i) | තොග ගිණුම | 153,850 | 1,345,374 | 1,191,524 |
| (ii) | **ඉතිරි කිරීමේ ගිණුම** ගිණුම් අංක11502007828 | 1,427,837 | 7,113,048 | 5,685,211 |
| | **ජංගම ගිණුම්** | | | |
| (iii) | ගිණුම් අංක-01- 1033468-02 | 2,993,420 | 5,793,120 | 2,799,700 |
| (iv) | ගිණුම් අංක-115010057027 අයිරාව | 730,837 | 5,130,237 | 4,399,400 |
| (v) | ගිණුම් අංක-115010018929 | 325,600 | 4,588,305 | 4,262,705 |
| (vi) | අත ඉතිරි මුදල් | 140,000 | 968,393 | 828,393 |
| | **එකතුව** | **5,771,544** | **24,938,477** | **19,166,933** |

### 2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් ගිණුම් ශේෂයන්ට අදාළව ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට හෝ නොහැකි විය.

| | ගිණුම් විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|---|
| | | රු. | |
| (i) | ස්ථාවර වත්කම් | 240,645,120 | භෞතික සත්‍යාපන වාර්තා |
| (ii) | ආපසු ගෙවිය යුතු තැන්පතු | 1,203,403 | තැන්පතු ලේඛන |
| (iii) | ලැබිය යුතු අනුග්‍රාහක ගාස්තු හා ප්‍රදාන | 17,170,577 | විස්තරාත්මක උපලේඛන |
| (iv) | ලැබිය යුතු වෙනත් ණය | 1,000,000 | විස්තරාත්මක උපලේඛන |
| (v) | විලම්භිත ආදායම | 146,285,797 | විස්තරාත්මක උපලේඛන |
| (vi) | රඳවා ගත් අරමුදල් | 4,582,669 | විස්තරාත්මක උපලේඛන |

**2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 757 ප්‍රකාරව සම්මේලනය විසින් 2016 වර්ෂය සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදු කර නොතිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සම්මේලනයේ මෙහෙයුම් කටයුතුවලින් වූ මූල්‍ය ප්‍රතිඵලය රු. 22,454,656 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 30,696,804 ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 8,242,148 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. මෙහෙයුම් වියදම රු. 35,269,589 කින් අඩු වී තිබුණද ජාත්‍යන්තර පාපන්දු සම්මේලනයෙන් ලද අරමුදල් රු.43,757,618 කින් පහළ යාම ඉහත පිරිහීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කළමනාකරණ ක්‍රියාකාරකම්**

2013 වර්ෂයට පෙර ලබා දී තිබූ රු. 859,708 ක අත්තිකාරම් මුදලද ඇතුලුව 2016 දෙසැම්බර් 31 දිනට සම්මේලනය මගින් තරඟ සංවිධායකවරුන්ට ලබා දී තිබුණු අත්තිකාරම්වල එකතුව රු.1,664,137 ක් විය. නියමිත කාර්යය අවසන් වූ පසු අත්තිකාරම් පියවීම සිදු කර නොතිබූ අතර, ලබා දිය යුතු උපරිම අත්තිකාරම් මුදල තීරණය කිරීම හා අත්තිකාරම් ලේඛනයක් පවත්වාගෙන යාම සිදුකර නොතිබුණි.

**4.2 කාර්ය මණ්ඩල පරිපාලනය**

සම්මේලනය සඳහා සංවිධාන ව්‍යුහයක් හා ඒ අනුව අනුමත කාර්ය මණ්ඩලයක් පැවතිය යුතු වුවද සම්මේලනය ආරම්භයේ සිට අනුමත කාර්ය මණ්ඩලයක් සහ සංවිධාන ව්‍යුහයක් නොතිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 ක්‍රියාකාරී සැලැස්ම**

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 5.2 වගන්තිය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**5.2 අයවැය ලේඛනමය පාලනය**

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/ 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.3 වගන්තිය ප්‍රකාර ඵලදායි මූල්‍ය පාලනයක් සඳහා එක් එක් මූල්‍ය වර්ෂය ආරම්භ වීමට ප්‍රථම අයවැය ලේඛනයක් පිළියෙල කළ යුතු වුවද, සම්මේලනය විසින් සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.

**6.** **පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින්වර සම්මේලනයේ සභාපතිවරයා දැනුවත් කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) අත්තිකාරම් ගෙවීම | අත්තිකාරම් පාලනය හා අධීක්ෂණය නොකිරීම. |
| (ආ) ස්ථාවර වත්කම් කළමනාකරණය | ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොගැනීම හා වාර්ෂික ස්ථාවර වත්කම් සමීක්ෂණයක් සිදු නොකිරීම. |
| (ඇ) මූල්‍ය පාලනය | (i) ජංගම බැංකු ගිණුම් අතර පාලනයකින් තොරව මුදල් මාරු කිරීම් සිදු කිරිම.<br>(ii) ගිණුම්වල වාසිදායක ශේෂ තිබියදි අයිරා ලබා ගෙන තිබීම.<br>(iii) බැංකු සැසඳුම් ප්‍රකාශන පිළියෙල නොකිරීම. |